අපෙන් දුරස් වුණු අපේ ආහාර නැවතත් අපේ ආහාර වට්ටෝරුවට ගෙන ආ. . .

# ආහාර උළෙල ගන්නොරුවේදී









මෙවර ලෝක ආහාර දිනය සැමරීමට "ජෛව විවිධත්වය තුළින් පෝෂණය" යන තේමාව යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සේවය හා මානව පෝෂණය හා ජෛව විවිධත්ව ව්‍යාපෘතිය (BFN project) හා එක්ව සංවිධානය කරන ලද ආහාර උළෙලක් 2017 ඔක්තෝබර් මස 16 වන දිනය පුරාවට ගන්නොරුව පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

මෙරට විවිධ ප්‍රදේශ වල එනම් නාගරික ප්‍රදේශ වලින් බැහැර ග්‍රාමීය ප්‍රදේශ වල ජෛව විවිධත්වය විදහා දක්වන ආහාර වර්ග හා ඒවා පිළියෙල කරන ආකාරය යලි මෙරට ජනයා අතරට යලිත් හඳුන්වා දී ඒවා ප්‍රචලිත කිරීම මෙම සුවිශේෂී වැඩසටහනේ ප්‍රධානතම අරමුණ විය. අතීතයේ දි මෙම ආහාර වර්ග ජනතාව බහුලව භාවිතයට ගැනුනු අතර වර්ථමානය වන විට ඒවා විවිධ හේතු නිසා භාවිතයෙන් ඈත්ව යමින් ඇත. බොහෝ ආහාර, එහි ඥාණය දත් ගැමියන්ගේ අභාවයත් සමඟ අපේ පාරිභෝජනයෙන් ඉවත් වී ඇත. වර්ථමානයේ වරින් වර ඇති වන කාළගුණික වෙනස්වීම් නිසා කෘෂිකර්මාන්තයට වන බලපෑම හේතුවෙන් ආහාර නිෂ්පාදනයට බලපෑම් ඇති වී ආහාර හිඟ අවස්ථාවන් උදාවී ඇත. එලෙසම අපේ ආහාර රටාවේ සිදුවූ වෙනස්කම් නිසා බෝ නොවන රෝග රැසක් වැළදීමේ අවදානමක් උද්ගතව ඇති අතර ගොවි තැනේ දී භාවිතා කරන කෘෂි රසායන ද්‍රව්‍ය නිසා සෞඛ්‍ය ගැටළු රැසක් ද ඇති වී ඇත. ජෛව විවිධත්වය හා ඇඳුණු ආහාර වර්ග ජනතාවගේ පරිභෝජනයට හඳුන්වා දීම මෙම ගැටළු බොහෝමයකට පිළියමක් ලෙස භාවිතා කළ හැකි බව විද්වතුන් පෙන්වා දි ඇත.

මෙම ආහාර උළලේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අන්තර පළාත් 6 ක් හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් දිස්ත්‍රික්ක 24 ක් ඒ ඒ ප්‍රදේශවල ආහාර හා පෝෂණය සඳහා ජෛව විවිධත්වය

4 පිටුවට. . .

3 පිටුවෙන්. . .

විදහා දක්වන ප්‍රදර්ශන කුටි 31 ක් ඉදිරිපත් කරන ලදි. ගන්නෝරුව ආහාර පර්යේෂණ අංශයෙන් කුටියක් හා උණ ගොබ ආශ්‍රයෙන් ආහාර සෑදීම පිළිබඳ කුටියක් ඉදිරිපත් කර ඇත. තවද ඌන භාවිත පලතුරු, එළවළු, පළා, දේශීය අල වර්ග ආශ්‍රිතව විවිධ ආහාර වර්ග හා ඒවායේ සැකසූ ආහාර වර්ග වල නිදර්ශක ඉදිරිපත් කර තිබුණි. මෙම ඉදිරිපත් කර තිබූ ආහාර වට්ටෝරු අතර තරඟයක්ද සංවිධානය කර තිබුණි. මින් ජයග්‍රහණය කරන ලද ආහාර වට්ටෝරු ඉදිරියේදී මෙරට පුරා විසිරී ඇති හෙළබොජුන් හරහා ජනතාව වෙත ගෙන යන බව කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සේවය කෘෂි පුවත් වෙත සඳහන් කරයි. එලෙසම මෙම ජෛව විවිධත්වය විදහා දක්වන ආහාර වට්ටෝරු ඇතුළත් කර ඉදිරියේදී ග්‍රන්ථයක්ද සම්පාදනය කිරීමට යෝජිතව ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් කීර්ති හෙට්ටිආරච්චි මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම උත්සවය පවත්වන ලද අතර මේ සඳහා මානව පෝෂණය හා ජෛව විවිධත්ව ව්‍යාපෘතියේ ලෝක සම්බන්ධීකාරක ඩැනි හන්ටර් මහතාගේ සහභාගීත්වය සුවිශේෂ සිදුවීමක් විය. ප්‍රවීණ සුපවේදී ශාන්තා මායාදුන්න මහත්මිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, මහජනතාව, කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්, ව්‍යාපාරිකයන්, පාසැල් සිසුන් ඇතුළු විශාල සංඛ්‍යාවක් මෙම අවස්ථාව සඳහා සම්බන්ධ විය.

---

වාර්තාව : සුබුද්ධිකා මධුමාලි - කෘෂිකර්ම උපදේශක
දර්ශනී බන්ඩුලසේන - කෘෂිකර්ම උපදේශක